වත්තල මාබෝල නගර සභාව
----------------------------
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වත්තල මාබෝල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ට්‍රැක්ටර්,ටේලර් හා කම්පැක්ටර් රථ ණය වාරික සඳහා රු.5,688,750 ක් මුද්දර ආදායම්වලින් අඩු කර තිබූ අතර එයින් රු.2,880,000 ක් 2020 වර්ෂයේ මුද්දර ආදායම් වූයෙන් එම වටිනාකමින් ණය අඩුවෙන් හා ආදායම් වැඩියෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයට ලැබූ ආදායම පමණක් ගිණුම්වලට ගැලපීම් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ලැබූ චෙක්පත සඳහා 2019 වර්ෂය වෙනුවෙන් ලද ආදායම් වන හෙයින් ණයවලින් අඩුකර ඇති බව දන්වමි. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල භෞතික තොග ශේෂය ගිණුම්ගත කිරීම වෙනුවට රු. 2,755,642 ක් වූ ලෙජර ශේෂය ගිණුම්ගත කර තිබුණි. | භෞතික ශේෂය ගිණුම් ගත කළ යුතුවේ. | 2020 අවසාන ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර මුදල රු.15,573,484 ක් වුවද එය රු.12,060,208 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මුළු මුදලම ගිණුම්ගත කළ යුතුවේ. | රැඳවුම් මුදල,ලිපිද්‍රව්‍ය හා මුද්දර ගාස්තු යන සියළුම ලැබිය යුතු ශේෂ ණයගැතියන්ගෙන් ඉවත් කර ඇති බව දන්වමි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 20 දින පියවීම් කර තිබූ රු.247,617 ක් පෙර ගෙවුම් ගිණුමට ගැලපීම් කර නොතිබුණි. | නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතුවේ. | 2016 පියවීම් කළ ශේෂයක් ඇතුළත්ව ඇති බව දන්වමි. |

1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 03 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 459,960 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට හා ගිණුම් නිවැරදි කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව දන්වමි. |

1.3.3 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 ඔක්තෝබර් සිට 2019 සැප්තැම්බර් 30 දක්වා කාලය තුල කසළ බැහැර කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.16,196,170 ක් ගිණුම් ගත කර නොතිබූ අතර එය පියවීම් කරද නොතිබුණි. | ගිණුම්ගත කිරීම හා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2017 වර්ෂයේ සිට ගාස්තු ගෙවීමක් සිදු නොකළද අත්හිටුවීමක් සිදු කර නොමැති බව දන්වමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.99,186,552 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා 2019 දෙසැම්බර් 31 දිනට විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | ගිණුම් නිවැරදි කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 103(1) හා 104(1) | හිටපු ගබඩා නිලධාරියා විසින් 2019 අගෝස්තු 07 වන දින, අනුමැතියකින් තොරව, ගබඩා භාණ්ඩ යම් ප්‍රමාණයක් රැගෙන ගොස් ඇති බව | වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතුවේ. | මූලික විමර්ශනයක් සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | ආනාවරණයවීම සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් පවත්වා වගකිව යුත්තන් හා ප්‍රමාණය නිශ්චය කර නොතිබුණි. | | |
| (ආ) | පළාත්පාලන කොමසාරිස්ගේ 2016 නොවැම්බර් 09 දිනැති අංක එල්ජීඩී/13/2016 දරන චක්‍රලේඛය | මාබෝල මාළු කඩය 2019 පෙබරවාරි 01 දින සිට 2024 ජනවාරි 31 දක්වා වර්ෂ 05 කට ගිවිසුම් ගතව තිබුණු අතර හැඳල වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක් 2014 දෙසැම්බර් 17 දින සිට වෙළඳ සැල කඩා ඉවත් කරන තුරු බදුදී තිබුණි. | ගිවිසුම්ගතවීම නියමිත කාල වකවානුවල සිදු කළ යුතුවේ. | ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට හා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.45,215,921 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.43,238,320ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. |
| (i) | වරිපනම් හා බදු | 56,365 | 56,510 | 54.277 | 37,991 | 56,065 | 56,198 | 46,935 | 40,944 |
| (ii) | කුලී | 14.663 | 12,004 | 17,550 | 9,398 | 14,600 | 11,467 | 15,357 | 10,076 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 770 | 1,189 | 1,234 | - | 400 | 835 | 872 | - |
| (iv) | වෙනත් ආදායම් | 93,580 | - | 42,073 | - | 82,878 | 85,277 | 85,277 | - |
| | | 165,378 | 69,703 | 115,134 | 47,389 | 153,943 | 153,777 | 148,441 | 51,020 |

2.2.2 වරිපනම් හා බදු
-----------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) වරිපනම් | | | |
| (i) | කොළඹ මීගමුව ප්‍රධාන පාර හැදල හන්දිය සිට මීගමුව දෙසට ඇති අංක 672 වරිපනම් දේපල සඳහා 2019 වර්ෂයට කිසිදු වරිපනම් අයකර නොතිබුණි. | වෙළඳ ස්ථානයක් ලෙස වරිපනම් අය කළ යුතුවේ. | ඉඩමක් ලෙස ලේඛනගත කර ඇති බව දන්වමි. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට කාල විශ්ලේෂණය අනුව වර්ෂ 03 කට වැඩි අයකර ගත යුතු වරිපනම් ශේෂය රු.21,617,184 ක් විය. | හිඟ අය කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ එකතු කිරීමට කටයුතු කරමි. |
| (ආ) ව්‍යාපාර බදු | | | |
| | ව්‍යාපාර බදු ආරම්භක හිඟ ශේෂය රු.1,472,327ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අය කිරීමට කටයුතු කළ යුතුවේ. | බදු ලේඛන පරීක්ෂා කර හිඟ හඳනා ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

2.2.3 කුලී
----

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කඩ කාමර 21 ක් ගිවිසුම්ගත විමකින් තොරව බදු දි තිබුණි. | ගිවිසුම් ගතවීමට කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් ගතවීමට හෝ පවරා ගැනිමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | කඩ කාමර 42 ක් සඳහා වූ ගිවිසුම් 2007 හා 2018 වර්ෂ අතර කාලවලදී අවසන්වී තිබුණ අතර නැවත එම ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ගතවීමට කටයුතු කළ යුතුවේ. | කෝවිඩ් තත්ත්වය නිසා බදු ගිවිසුම් අත්සන් කිරීමට දී ඇති කාලය දිර්ඝ කර ඇති බව දන්වමි. |
| (ඇ) | දුම්රියපල පාර, හැඳල, වත්තල, මාබෝල වෙළඳ සැල්වල 2019 දෙසැම්බර් 31 වන විට කඩ කාමර 92 ක හිඟ කඩ බදු කුලිය රු.6,219,529 ක් වු අතර 2020 ජූනි 11 දින වන විට අය කර තිබුණේ රු.210,635 ක් පමණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී විධිමත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පාවහන් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ඇතුළුව පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ස්ථාන 21 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | බලපත්‍රයක් ලබානොගත් ආයතන සඳහා නීති මඟින් කටයුතු කළ යුතුවේ. | කොන්දේසි නිවැරදි කිරීම සඳහා සාධාරණ කාලයක් ලබාදී ඇති බව දන්වමි. |

2.2.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ඔක්තෝබර් 31 දිනට ආයතන 254 ක කසළ අපහරණ ගාස්තු මාස 15 – 54 අතර කාල පරාසයක රු.5,898,415 ක් හිඟව පැවතියද එම ආයතනවල කසළ අපහරණය දිගින් දිගටම සිදුකොට තිබුණි. | හිඟ අය කිරීමට කටයුතු කළ යුතුවේ. | අයකරගත නොහැකි කසළ ගාස්තු නිත්‍යානුකූලව අය කර ගැනිමට පියවර ගන්නා බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදුමංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) වාර්ෂික කාර්ය සාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික කාර්යසාධන වාර්තාවේ සඳහන් විද්‍යුත් පළාත් පාලන පද්ධතියක් ඇති කිරීම යන අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන සැලැස්මට අනුව ක්‍රියාකාරකම් ඉටු කළ යුතුවේ. | අළුතින් වෙබ් අඩවියක් නිර්මාණය කරමින් පවතින බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත්පර්චස් 79 ක ඉඩම විකිණීම හා සභාවට අයත් ඉඩම් ගොඩනැගිලි බදුදීම සම්බන්ධයෙන් 2019 නොවැම්බර් 07 වන දින පවත්වන ලද රාජ්‍ය ගිණුම් පිළිබඳ විශේෂ කාරක සභා රැස්වීමේ නියෝග ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ගොවිජන සේවා කොමසාරිස් වෙතින් මෙම ඉඩම ගොඩ ඉඩමක් බවට අදාල නිර්දේශය මෙතෙක් ලබාගෙන නොතිබුණි. | රාජ්‍ය ගිණුම් පිළිබඳ විශේෂ කාරක සභා රැස්වීමේදී නියෝග ක්‍රියාත්මක කළ යුතුවේ. | පළාත් පාලන ලේකම් මඟින් ගොවිජන සේවා කොමසාරිස් මඟින් දැනුවත් කර ඇති බව දන්වමි. |
| (ආ) | 2019 නොවැම්බර් 07 වන දින පවත්වන ලද රාජ්‍ය ගිණුම් පිළිබඳ විශේෂ කාරක සභා රැස්වීමේදී සාකච්ඡාවට බදුන්වූ නගර සභාවට අයත් පර්චස් 79 ක ඉඩමේ වෙනත් ආයතනයකට අයත් ඉඩමකට බද්ධව ගොඩනැගිල්ලක් ඉදිකර තිබීම පිළිබඳව එම ගොඩනැගිල්ලෙන් ඉඩම වෙන් කර ගෙන නිසි පරිදි වැට මායිම් යොදා සභාව සතු ඉඩමක් බව දැක්වෙන පරිදි දැන්වීම් පුවරුවක් යෙදීම, එහි ඉදිකර තිබූ ගොඩනැගිල්ල ඉවත් කිරිම හා සවි කර තිබූ යන්ත්‍ර සූත්‍ර ඉවත් කර සභාවේ නිරවුල් භුක්තිය ලබා ගැනීමේ කටයුතු ඉටු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් පිළිබඳ විශේෂ කාරක සභා රැස්වීමේදී නියෝග ක්‍රියාත්මක කළ යුතුවෙ. | නිරවුල් භුක්තිය ලබා ගැනිමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | විශ්‍රාම ගොස් ඇති හා ස්ථාන මාරු ලැබ ගොස් ඇති නිලධාරින් දෙදෙනෙකුගෙන් අය කල යුතු නිල නිවාස කුලිය රු.69,399 ක් අය කර ගෙන නොතිබුණි. | නිල නිවාස කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිල නිවාස කුලිය හා හිඟය අය කිරීම සඳහා දන්වා යවා ඇති බව දන්වමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වත්තල මාබෝල ප්‍රදේශයේ මාර්ග පලුදු කිරීම් අවස්ථා 55 කට අදාලව රු.222,590 ක් අයකර තිබුණත් එම අලුත්වැඩියාවන් සඳහා සභා කම්කරුවන් | බඳවා ගත් මාර්ග කම්කරුවන් යොදවාගෙන සිදු කළ යුතුවේ | පලුදු කළ මාර්ග සකස් කිරීමට අමතරව වෙනත් වැඩ කොටස්ද ආවරණය කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | නොයොදවා කොන්ත්‍රාත්කරුවන්ට පවරා රු.851,034 ක් ගෙවා තිබුණි. | | |
| (ආ) | 2012 මැයි 10 දිනැති පළාත් පාලන හා පළාත් සභා අතිරේක ලේකම්ගේ ලිපිය අනුව පළාත් පාලන ආයතනවල බදු මුදල සංශෝධනය කිරීම වසර 05 කට වරක් සිදුකල යුතු වුවද හැඳල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අවසන්වරට 2008 වර්ෂයේ තක්සේරු කර තිබූ අතර එම තක්සේරුව ක්‍රියාත්මක කර තිබුණේ 2019 වර්ෂයේදීය. කට්ටියාවත්ත, මාබෝල, දුම්රිය පොල පාර හා වත්තල වෙළඳ සංකීර්ණවල පිහිටි කඩ කාමර තක්සේරු කර නොතිබුණි. | බදු මුදල සංශෝධනය වසර 05 කට වරක් සිදු කළ යුතුවේ. | 2008 වර්ෂයේ ලබා ගන්නා ලද තක්සේරුව මෙතෙක් ක්‍රියාත්මක නොවූ බැවින් එයට යටත්ව ගිවිසුම යාවත්කාලීන කරන ලදී. |
| (ඇ) | දුම්රිය පොල පාරේ කඩ කාමරයක් 2013 ජූලි 30 දිනැති සභා තීරණ අනුව වසර 05 කට බදු දීමට තීරණය කර තිබුණද 2013 අගෝස්තු 07 දින සිට වසර 15 ක් සඳහා බදු දී තිබුණි.තවද මෙම කඩ කාමරයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු හිඟ කුලිය රු.141,693 ක් විය. | හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර දීර්ඝ කාලීනව බදුදීම සිදු නොකළ යුතුවේ. | ගිවිසුමේ අඩුපාඩු සොයා බලා ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | බාලහේනවත්ත හෙවත් කැටකැලගහ වත්ත ඉඩම,මාබෝල ග්‍රාමයේ පිහිටි පොදු වෙළඳ පොළ ඉඩම, හැඳල හන්දියේ පිහිටි කහටගහ කුඹුර ඉඩම හා වත්තල හැඳල හන්දියේ පිහිටි පොදු වෙළඳ පල භූමියේ ඉඩම, අවුරුදු 30 ක කාල සීමාවකට බදුදී තිබූ අතර අවසානයේ තවත් අවුරුදු 20 කට බදු දීමට ගිවිසගත හැකිවන ලෙස බදු ගිවිසුම්වල ප්‍රතිපාදන ඇති කර තිබුණි. තවද ටෙන්ඩර් ක්‍රියාවලියක් අනුගමනය කර බදු දී තිබූ බවට අනාවරණය නොවූ අතර වර්ෂ 05 ට වරක් තක්සේරු කර බදු මුදල සංශෝධනය විය යුතු වුවද එවැනි කොන්දේසියක් බදු ගිවිසුමේ අන්තර්ගත නොකිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම අහිමිව තිබුණි. | සභාවට වාසිදායක වන අයුරින් ගිවිසුම්වලට ඇතුලත් විය යුතුවේ. | ඉඩම් බදුදී ඇත්තේ 1986/6 දරන චක්‍රලේඛය අනුව බව දන්වමි. |
| (ඉ) | අවස්ථා 02 කට අදාළව ඉඩම් බදු දීමේදී බදු ගිවිසුමේ වසර 05 කට වරක් බදු මුදල සංශෝධනය විය යුතු බවට සඳහන් කර නොතිබුණි. | බදු ගිවිසුම්වල වසර 05 කට වරක් බදු මුදල සංශෝධනය වන බවට ප්‍රතිපාදන ඇතුළත් කළ යුතුවේ. | නාගරික සංවර්ධන අධිකාරියෙන් තොරතුරු ලබාගෙන යථා කාලයේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.4 ප්‍රසම්පාදනය

--------------

3.4.1 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------ | --------- | ------------------------------------ |
| සුදුවැල්ල පාර ඉන්ටලොක් ගල් සපයා ඇතිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයකට රු.963,841 ක් ගෙවා තිබූ නමුත් 2019 නොවැම්බර් 27 දින භෞතික මිණුම් ගැනීමට අනුව වර්ග මීටර් 10.69 ක් සඳහා රු.33,502 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි . | නිවැරදි මිනුම් සඳහා ගෙවීම් කළ යුතුවේ. | මෙම මාර්ගයේ පළල විෂමාකාර බැවින් මිනුම් ගැනීමේදී ස්ථාන කිහිපයකින් ගෙන ප්‍රමාණය ගණනය කිරීම් කර ඇති බව දන්වමි. |